**කන්තලේ ප්‍රාදේශීය සභාව 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | එකතුව රු.675,438 ක් වූ රැඳවුම් තැන්පතු ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසුවීමකින් එම ශේෂය ගිණුම් වලින් මඟහැරී ඇත. ඉදිරියේදි ගිණුම් සකස් කරන විට එය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 4,002,641 ක පොදු ගබඩා තොග සහ රු.405,457 ක ආයුර්වේද තොග ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා අතර, මෙම වරද ඉදිරි වසරේ ගිණුම් සකස් කරන විට නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඇ) | ජ'නල් සටහන් මඟින් වර්ෂයේ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමේදී එය පෙර වර්ෂයේ ආදායමක් ලෙස සමුච්චිත අරමුදලට බැරකිරීම නිසා වර්ෂයේ ආදායම රු.9,020,931 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වරද ජ'නල් සටහන් මගින් ඉදිරියේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරන බව සහ ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු රු.2,217,525 ක බිල්කිරීම් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | වැරදීමකින් එම ශේෂය සමුච්චිත අරමුදලට ගැලපීම්කර ඇති නමුත් ඉදිරියේදී එවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා බව. | -එම- |
| (ඉ) | ජ'නල් සටහන් මඟින් ආරම්භක ශේෂ ගැලපීමේදී රු.7,054,592 ක් වූ මුදල් ශේෂය හා රු.7,157,988 ක් වූ ණය හිමි ශේෂ ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරගන්නා බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු අතර 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.416,770 ක විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | අතපසුවීමකින් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරන බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය රු.2,901,112 ක් හා රු.375,000 මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි අගය ගණනය කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඌ) | ස්ථාවර තැන්පතු රු.2,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදයමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැඩියෙන් ගිණුම්ගතකර කර ඇති පොලී ආදායම ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (එ) | එකතුව රු.507,330 ක් වටිනා පරිත්‍යාග ලෙස ලැබුණු භාණ්ඩ ස්ථාවර වත්කම්වලට ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම්වලට ගෙන නොතිබුණු රු.507,330.00 ක් වටිනා පරිත්‍යාග අතපසුවීමකින් ගිණුම්ගත නොකිරීම ඉදිරි වසරේදි ගිණුම් සැකසීමේදී නැවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.322,528,464 ක් වූ ගිණුම් ශේෂ 07 ක් ඔප්පු, වත්කම් පවරා ගැනීමේ ලේඛන, උපලේඛන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අදාළ අඩුපාඩු නිවැරදි කරන බව. | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

**1.6.3 නොසැසඳුනු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 03 ක එකතුව සහ ඒවාට අදාළ ලේඛනවල එකතුන් අතර රු.432,548 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදිව සකස් කරන බව. | ලේඛන නිසි පරිදි පවත්වා ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව සතු මාර්ග හඳුනාගෙන ඒවා ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මාර්ග ඉන්වෙන්ට්‍රියක්ද නොවීය. | කාර්යාලයේ පවතින මාර්ග ඉන්වෙන්ට්‍රියේ අඩුපාඩු සකස් කර ඇතුලත් නොවී ඇති සභාව සතු මාර්ග ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ බව. | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 134 වගන්තිය | බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ කලින් කලට හඳුනාගෙන වරිපනම් බදු අයකළ යුතු වුවද 1980 වර්ෂයට පෙර හඳුනාගත් ප්‍රදේශ සඳහා පමණක් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යය සාධන වාර්තා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 371 (2) (ආ) වැනි රීතිය | සභාව අවස්ථා 04 කදී ලබාදී තිබූ රු.180,000 ක අතුරු අග්‍රිමයන් දින 38 ත් 274 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි. | සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් අදාල අත්තිකාරම් මුදල ලබා දීමට කටයුතු කර ඇති අතර මින් ඉදිරියේදී එවැනි | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුත්තක් සිදු නොවීමට වග බලා ගන්නා බව. | |
| (ii) | 880 වැනි රීතිය | ඇප තැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකුගෙන් නියමිත පරිදි ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් කිහිප දෙනෙකු ඇප තැන්පත් කර ඇති අතර අනෙකුත් නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (iii) | 1645(ආ)1646 වැනි රීතිය | සභාව සතු වාහන 20 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023.07.23 දින දෛනික ධාවන සටහන් සාරාංශ අදාල කාළ සීමාවට විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඇ) | 2010 අංක 06 දරණ නැගෙනහිර පළාතේ මුද්දර බද්ද හැරවීමේ ප්‍රඥප්තිය. | 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලසීමාව වෙනුවෙන් ඉල්ලුම් නොකළ රු.1,783,680 ක මුද්දර ගාස්තුවක් පැවතුණි. | රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තොරතුරු ඉල්ලා ඇති අතර, එම විස්තර ලැබුණු පසු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 51,602,610 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 7,741,850 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 4,647 | 3,367 | 2,352 | 12,674 | 2,220 | 2,220 | 548 | 11,659 |
| කුලී | 12,625 | 6,931 | 5,173 | 4,739 | 9,600 | 6,788 | 6,207 | 2,981 |
| වෙනත් ආදායම් | 1,900 | 4,900 | 4,900 | 5,946 | 11,500 | 25,196 | 19,458 | 5,946 |
| | ------------ | ----------- | ----------- | ------------ | ------------- | ----------- | ------------ | -------------- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 19,172 | 15,198 | 12,425 | 23,359 | 23,320 | 34,204 | 26,213 | 20,586 |
| ======= | ======= | ======= | ======= | ======== | ======= | ======= | ======== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර් සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට රු.12,673,815 ක හිඟ වරිපනම් පැවති අතර ඉන් අවස්ථා 18 කදී රු.50,000 ට වැඩි ප්‍රමාණයෙන් අයවිය යුතු හිඟ බදු ශේෂය රු.1,097,105 ක් විය. | ලබන වසරේ සිට පවතින හිඟ ශේෂයන් නිසියාකාරව අය කර ගැනිමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කඩ කාමර කුලී** | | |
| පොදු වෙළඳපොළ කඩ කාමර 66න් 18 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන තිබූ අතර එම කාමර 18 න් අයවිය යුතුව තිබූ කුලී මුදල් සභාවට අහිමි වී තිබුණි. | කඩ කාමර ටෙන්ඩර් කිරීමේදි කිසිවෙකු බදුගෙන නොමැති 2023 වර්ෂයේදි රු.1600.00ක මුදලකට මෙම කඩ කාමරය බදු දීමට සභා තීරණයක් ගෙන ඇති අතර, මේ වන තෙක් කිසිවෙකු ඒ සඳහා ඉල්ලුම් කර නොමැති බව. | වසා ඇති කඩකාමර විධිමත්ව බදු දිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කායර්සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 05 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැති බව. | විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. |

**2 මෙහෙයුම් අකායර්ක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් ප්‍රතිලාභීන්ට ලබාදීමට නියමිත භාණ්ඩ සෘජුවම ප්‍රතිලාභියාට නිකුත් නොකර කොට්ඨාශය නියෝජනය කරන සභිකයා වෙත නිකුත් කර තිබුණි. මෙම භාණ්ඩ නිසි පරිදි අදාළ පාර්ශවයන් වෙත ලැබුණේදැයි තහවුරු කළ හැකි කිසිවක් සභා ගොනු තුළ නොවීය. අවස්ථා 04 කදී එසේ බෙදා දුන් රු.398,790 ක් වටිනා භාණ්ඩ ලද බවට කිසිදු තහවුරුවක් නොවීය. | අදාල පාර්ශවයන් විසින් කොට්ඨාශ භාර මන්ත්‍රීවරයාගෙන් එම ද්‍රව්‍ය ලබාගත් බවට ලිපි මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බව. | පනතට අනුකූලව කාර්ය ඉටු කිරීමට හා විනිවිදභාවකින් කටයුතු කළ යුතුය. |
| (ආ) | උප සභාපතිවරයාගේ ලිඛිත ඉල්ලීමකට අනුව ප්‍රජා මූල සංවිධානයකට නිකුත් කළ බව සඳහන් රු.97,933 ක් වටිනා කාර්යාල මේස 02 ක් හා පුටු 02 ක් විගණනය විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී උපසභාපතිවරයාගේ නිවසේ රඳවා තිබූ බව නිරීක්ෂණය විය. | උප සභාපතිවරයා වෙත අදාල කොට්ඨාසයේ සමිති විසින් කරන ලද ඉල්ලීම අනුව මෙම භාණ්ඩ උත්සවයක් සංවිධානය කර බෙදා දීමට කටයුතු කර ඇති බව. | -එම- |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත සේවක මණ්ඩලය හා සත්‍ය වශයෙන් සිටින සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 11 ක පුරප්පාඩු 22 ක් පැවතුණි. | පුරප්පාඩු වී ඇති තනතුරු සංඛ්‍යාව පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පූර්ව වර්ෂ විගණනය තුළින් පෙන්වා දී තිබූ පරිදි සභාවේ සේවයේ නියුතුව සිට සේවය හැරගිය හා සේවයෙන් ඉවත් කළ සේවකයන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.1,317,414 ක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 වගන්තිය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීම සම්බන්ධව නීති උපදෙස් ලබාගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් අමුණුම 02 ආකෘතිය පදනම් කර ගනිමින් සභාව විසින් මානව සම්පත් සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් සැළැස්ම සකස් කිරීම මේවන විට ආරම්භ කර ඇති බව. | -එම- |

## 3.4 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ගලි බවුසරයේ සේවය ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.842,060 ක ඉන්ධන වියදමක් දරා තිබූ අතර ඒ සඳහා ඉපයීම් ලෙස රු.188,900 ක ආදායමක් පමණක් උපයා තිබුණි. | මේ වන විට ගලිබවුසරය මනා අභ්‍යන්තර පාලනයක් යටතේ කුලියටදීම සිදු කරන අතර දැනට පවතින අධික ඉන්ධන වියදම මත මෙම වර්ෂයේ සිට එක් වරක් සඳහා ගලි බවුසර් ගාස්තුව රු.9000.00 ක කුලී පදනමක් මත ලබා දීමට තීරණය කර ඇති බව. | වාහන පාලනය විධිමත් කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සභාව වෙත ලබා දී තිබුණු JCB යන්ත්‍රයේ අලුත්වැඩියාව සඳහා පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) මඟින් රු.1,903,500ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එය 2021 දෙසැම්බර් 15 දිනට ප්‍රථම අවසන් බිල්පත් ඉදිරිපත් කිරීමට නියමිතව පැවතුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රය අළුත්වැඩියා කර නොතිබූ අතර අළුත්වැඩියාකරු විසින් JCB යන්ත්‍රයෙහි එන්ජිම ගලවා ගෙන ගොස් තිබුණි. | RS-1461 දරණ JCB යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධව මූලික විමර්ශනයක් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ආරම්භකර ඇති නිසා පරික්ෂණයේ ප්‍රතිඵල මත ඉදිරි කටයුතු සිදු කරන බව. | -එම- |
| (ඇ) | යන්ත්‍රය අලුත්වැඩියා කර නොතිබියදී කන්තලේ ඩිපෝවේ සහකාර කළමනාකරණ ඉංජිනේරුවරයා විසින් එම අළුත්වැඩියාව නිමකර ඇති බවට ව්‍යාජ ලේඛන සකසා 2021 දෙසැම්බර් 10 දින අත්සන් හා නිලමුද්‍රාව තබා අළුත්වැඩියාව නිමකර ඇති බවට සහතික කර තිබුණි. ඒ මත 2022 අගෝස්තු 15 දින අළුත්වැඩියාකරුවෙකු වෙත රු.648,500 ක් ගෙවා තිබුණි. | -එම- | -එම- |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| එක් එක් වර්ෂයේ ගිණුම් ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම බලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2023 ජුනි 01 වන දින දීය. | අවසන් ගිණුම් පිළියෙල කිරීමට දත්ත ලබාදිය යුතු නිලධාරීන් 05 දෙනෙකු වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබ නිදහස්කර තිබූ නිසා නවක නිලධාරීන්ට එම තොරතුරු සොයා ගැනීමට ප්‍රමාද වූ නිසා | චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නිශ්චිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරි වර්ෂයේ එම ප්‍රතිපාදන වලක්වා ගැනීමට කටයුතු කරන බව. | |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරීන් 03 දෙනෙකු පත්කර තිබුණද විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර වාර්තා පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර නිලධාරින් 02 කු පත්කර විගණන නිලධාරිතුමා විසින් ලබාදෙන ලද උපදෙස් අනුව කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණන විධිමත් කළ යුතුය. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| අංක DNA/2019(1) දරන චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු 04 ක් පවත්වා තිබුණද විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී කරවා ගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ සිට විගණන කළමනාකරණ කමිටුවම විගණකාධිපති දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගි කර ගැනීමට අවශ්‍යාකර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.4 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 06 ක සියයට 19.67 සිට සියයට 232.87 දක්වාද වියදම් විෂයයන් 05 ක සියයට 60.54 සිට සියයට 99.87 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

## 4.5 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා අදාළ නිර්ණායක සමාලෝචිත වර්ෂයේදීද හඳුනාගෙන නොතිබුණි. | 2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනතේ ඇතුලත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කවලට අදාල නිර්ණායක සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන ඇත. ඒ සම්බන්ධ වාර්තා අමුණා ඇත ි බව. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක අත්පත් කර ගත යුතුය. |